# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION
(Ministry of Public Services, Provincial Councils & Local Government)

තැ.පෙ. / த.பெ.இ / P.O. Box 1123

28/10, මලලසේකර මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව
28/10, மலலசேகர மாவத்தை, கொழும்பு 07. இலங்கை
28/10, Malalasekara Mawatha, Colombo 07. Sri Lanka

Telephone : 94 11 5980200
Fax : 94 11 2584406
E-mail : mail@slida.lk
Web : www.slida.lk


මගේ අංකය: SLIDA/ADG/RDNMT/01/GEN/1/2020

2022.01.04

අමාත්‍යාංශ ලේකම්වරු
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු.
පළාත් ප්‍රධාන ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරු
ප්‍රාදේශීය ලේකම්වරු.

12 JAN 2022

මහත්මයාණෙනි/මහත්මියනි

**විධායක නොවන නිලධාරීන් අරමුණුකරගත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම**

කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ගොඩනැගීමේ අරමුණ පෙරදැරිව රාජ්‍ය සේවයේ ප්‍රමුඛතම පුහුණු ආයතනය වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විධායක නොවන නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා සමරූපීතාවකින් යුක්තව ක්‍රියාත්මක කිරීම සඳහා නව ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට තීරණය කර ඇත.

1. පුහුණුකරුවන් ලෙස ලියාපදිංචිවීමට කැමති නිලධාරීන්ගේ ජීව දත්ත එක්රැස් කිරීම
2. එම නිලධාරීන් "පුහුණුකරුවන් පුහුණු කිරීමේ" වැඩසටහනකට යොමු කිරීම.
3. සාර්ථකව පුහුණුව අවසන් කරන නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සහතිකයක් පිරිනැමීම හා බාහිර පුහුණුකරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීම.
4. ලියාපදිංචි වූ පුහුණුකරුවන් ගේ නාම ලේඛනය පුහුණුකරුවන්ගේ සංචිතයක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන වෙබ්අඩවියේ පළකිරීම.
5. පුහුණු කිරීමේ අත්පොත් හා මාර්ගෝපදේශ සකස් කිරීම.
6. එම අත්පොත් හා මාර්ගෝපදේශ බාහිර පුහුණුකරුවන් වෙත ලබා දීම.
7. මාණ්ඩලික නොවන නිලධාරීන් අරමුණුකර දිවයින පුරා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. ඒ සඳහා බාහිර සම්පත් දායකයින් ලෙස පුහුණුව ලැබ ලියාපදිංචි නිලධාරීන් යොදාගැනීම හා රජයේ අනුමත ගෙවීම් ක්‍රමවේදය අනුව එම සම්පත් දායකයින්ට අදාළ ආයතන හරහා ගෙවීම් සිදු කිරීමට කටයුතු කිරීම.
9. අර්ධවාර්ෂික ව වැඩසටහන් සමාලෝචනය කිරීම (පුහුණු වැඩසටහන් හා ඒවායේ අන්තර්ගතය කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව).
10. අඛණ්ඩ පුහුණු චක්‍රයකට නිලධාරීන් යොමු කිරීම හා සේවාරම්භක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
11. සමරූපීතාවකින් යුත් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට සහාය වීම.

02. ඉහත කටයුත්ත ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර වශයෙන් දැනට දිවයින පුරා විසිරී සිටින සියලුම දීප ව්‍යාප්ත සේවා හා අනෙකුත් සේවා වලට අයත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් රාජ්‍ය අංශයේ පුහුණු වැඩසටහන් සඳහා සක්‍රිය ව දායකවීමට කැමත්තක් දක්වන නිලධාරීන් බාහිර සම්පත් දායකයින් ලෙස ලියා පදිංචි කිරීමේ කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට තීරණය කර ඇත. එසේ ලියාපදිංචි කරගනු ලබන සම්පත් දායකයින්ට පුහුණු වැඩසටහන්වලදී සම්පත්දායකත්වය ලබා දීම හෝ පුහුණු කිරීමේ අත්පොත් හා මාර්ගෝපදේශ සකස් කිරීම හෝ එම කටයුතු දෙකම හෝ සඳහා සහභාගී විය හැකිය. එම සියලු කාර්යයන් සඳහා අනුමත සීමා යටතේ ගෙවීම් සිදු කෙරේ.

03. ඉහත කරුණු පිළිබඳව ඔබ ආයතනයේ නිලධාරීන් දැනුවත් කර ඒ සඳහා උනන්දුවක් දක්වන නිලධාරීන්ගේ ජීව දත්ත මේ සමග අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරවා ඔබගේ නිර්දේශ සහිතව 2022.01.31 දිනට පෙර පහත ලිපිනයට යොමු කරන ලෙස කරුණාවෙන් ඉල්ලමි. ලිපි කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි “බාහිර පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම” යනුවෙන් සඳහන් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන්නේ නම් මැනවි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ හා සංවර්ධන සහ කළමනාකරණ නොවන පුහුණු)
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10, මලලසේනර මාවත
කොළඹ 07

එසේ නැතහොත්

අදාළ නිලධාරීන් විසින් පහත දැක්වෙන මාර්ගගත යොමුව ඔස්සේ අයදුම්පත පුරවා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත මාර්ගගත ව යොමුකර, එසේ යොමුකළ අයදුම්පතහි මුද්‍රිත පිටපතක් ඔබගේ නිර්දේශ සමග ඉහත ලිපිනයට එවන ලෙස අදාළ නිලධාරීන්ට දැනුම් දෙන්නේ නම් මැනවි. එමගින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් කඩිනමින් සංවිධානය කිරීම පහසු වේ.

https://forms.office.com/r/RfAwdETAnY - පුහුණු කිරීමේ අත්පොත් හා මාර්ගෝපදේශ සකස් කිරීම

https://forms.office.com/r/rXkYWJrEPH - පුහුණු කිරීම

04. කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ගොඩනැගීමේ සත්කාර්යය සඳහා අප හා අත්වැල් බැඳගැනීමට ඔබට කරන මේ ඇරයුම පිළිගෙන වඩා යහපත් දේශයක් ගොඩනැගීමේ කාර්යයට දායකවීමට සාදරයෙන් ඇරයුම් කරමි.

05. පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ උපදේශක ජේ. ජයසුන්දර මහතා නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි. දුරකථන අංක 0115980278/0714406152 හා jaye@slida.lk විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ ඒ මහතා සම්බන්ධ කර ගත හැකිය.

ස්තූතියි.

මෙයට - විශ්වාසී



ආචාර්ය පී.ජී.ඩී ප්‍රදීපා සේරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්